# රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
# பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
# Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව
சுதந்திர சதுக்கம் கொழும்பு 07 இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | MPubAd/AcSD/13/පොදු | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2024.06.28 |

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>රාජ්‍ය සේවයේ තනතුරුවලට පත් කිරීම් / උසස් කිරීම්වලට අදාළව සේවා ව්‍යවස්ථාවේ සඳහන් සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්වලට අදාළ සහතිකවල වලංගුභාවය තහවුරු කිරීම - ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය</u>

සේවා ව්‍යවස්ථාවල සඳහන් පත්කිරීම් / උසස් කිරීම්වල දී සුදුසුකම් සනාථ කිරීම සඳහා නිලධරයන් විසින් ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්වලට අදාළ සහතික, අදාළ තනතුරේ පරිපාලන බලධාරීත්වය දරනු ලබන අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් එම සහතික නිකුත් කරන ලද ආයතනයෙන්ම සනාථ කර ගැනීමෙන් අනතුරුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු බවට එම කොමිෂන් සභාව තීරණය කර ඇති බව රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/PRO/HB/26/2023 හා 2023.08.25 දිනැති ලිපිය මඟින් දන්වා ඇත.

02. තවද, සුදුසුකම්වලට අදාළ සහතිකවල වලංගුභාවය තහවුරු කර ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත තීරණ ගෙන ඇති බව එම කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/PRO/HB/26/2023 හා 2023.11.29 දිනැති ලිපිය මඟින් දන්වා ඇත.

i. සුදුසුකම්වලට අදාළ සහතිකවල වලංගුභාවය තහවුරු කර ගැනීමේ දී දැරිය යුතු පිරිවැය සහතිකලාභී නිලධාරියා විසින් දැරිය යුතු බව

ii. රජය මඟින් ලබාදෙන විදේශ ශිෂ්‍යත්ව යටතේ තෝරා ගැනීමේ ක්‍රියාවලියක් අනුව තෝරාගත් විදේශ උපාධි පාඨමාලා හැදෑරීමේ ශිෂ්‍යත්ව පිරිනැමූ නිලධාරීන් හදාරා ඇති පශ්චාත් උපාධි පාඨමාලා සහතිකවල වලංගුභාවය තහවුරු කර ගැනීමේ අවශ්‍යතාවයක් නොමැති බව

03. ඒ අනුව මින් ඉදිරියට ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියට සහ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම් සඳහා අයදුම් කිරීමට අපේක්ෂිතව සිටින නිලධරයින්ගේ පශ්චාත් උපාධි අදාළ විශ්වවිද්‍යාලවලින් සනාථ කර ගැනීම සඳහා, පශ්චාත් උපාධිය සම්පූර්ණ කළ පසු පහත ලේඛන **ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07** යන ලිපිනය වෙත කඩිනමින් යොමුකරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

i. පශ්චාත් උපාධියට අදාළ උපාධි සහතිකයේ සහ විස්තරාත්මක ප්‍රතිඵල සහතිකයේ සහතික කරන ලද පිටපත්

ii. විදේශ විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි සනාථ කර ගැනීම සඳහා අදාළ විශ්වවිද්‍යාල වෙත යොමුකිරීමට විශ්වවිද්‍යාල පරිපාලනය අමතමින් සකස් කරන ලද නිලධරයාගේ ඉල්ලීම් ලිපිය

04. සහතිකයක වලංගුභාවය තහවුරු කර ගැනීම සඳහා මුදල් අයකිරීමක් යම් ආයතනයක් විසින් සිදු කරන්නේ නම් එම මුදල ගෙවීම් කිරීම සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

05. මේ සම්බන්ධව ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් දැනුවත් කරන්නේ නම් මැනවි.

එස්. ආලෝකබණ්ඩාර
අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන) (වැ.බ.)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ
ලේකම් වෙනුවට


දුරකතන : 0112698672
ෆැක්ස් : 0112693304
විද්‍යුත් ලිපිනය : d.acsd.pubad@gmail.com